ශ්‍රේණිය - 09 ශ්‍රේණිය

විෂය - බුද්ධ ධර්මය

වාරය - II වාරය

පාඩම - 9 වැනි පාඩම

ඒකකය - සීල සුගන්දයම උතුම් වන්නේය.


සදුන් මල් ගුණ සුවද
උඩු සුලගට නොයයි
මිනිසුන්ගේ ගුණ සුවද
හැම දෙසම හමා යයි..........
අපි බොදුනුවන් වෙමු
ගුණ සුවද විහිදාලමු.
නැණ නුවණ වඩවමු...........
පන වගේ බුදු දහම සුරකිමු........



සීලය යනු කායික වාචසික ශික්ෂණයයි.

(කාය වාචානං සමෝධානං සීලං)

දුශ්චරිතයෙන් මිදි පුද්ගලයා සුචරිතයේ නිරත වූ විට ඔහු තුළ හික්මීමක් ඇති වෙයි.

නිවන් මගේ අත්තිවාරම/පදනම සීලයයි. ඊට හේතුව සීලය මත පිහිටා සෙසු ප්‍රතිපදාවන් අනුගමනය කරන නිසාය.


නිවන් ලබා දෙන දුක නැති කරන මාර්ගය.
(දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදාව) ත්‍රිවිධ ශික්ෂාවෙන් සමන්විත වෙයි.
සීල ශික්ෂාව
සම්මා වාචා (නිවැරදි වචනය)
සම්මා කම්මන්ත (නිවැරදි ක්‍රියාව)
සම්මා ආජීව (නිවැරදි දිවි පැවැත්ම)
මෙහිදී කායික හා වාචසික දුෂ්චරිතයෙන් මිදී සුචරිතයේ යෙදිය යුතුය.



- සීලයේ ප්‍රධාන කොටස් දෙකකි. එනම්,

චාරිත්‍ර සීලය → සමාදානය
චාරිත්‍ර සීලය → කළ යුත්ත
චාරිත්‍ර සීලය → සිරිත

වාරිත්‍ර සීලය → විරමණය
වාරිත්‍ර සීලය → නොකළ යුත්ත
වාරිත්‍ර සීලය → විරිත

# සීලය

## චාරිත්‍ර සීල

- සියලු සත්වයන් කෙරෙහි දයාව හා මෛත්‍රිය දැක්විය යුතුය
- දුන් දේ පමණක් ගැනීම
- ශිෂ්ට සම්පන්න අඹු සැමි ජීවිතයක් ගත කිරීම
- සත්‍ය වචන කතා කිරීම
- සතර ඉරියව්වෙන් සිහියෙන් කටයුතු කිරීම

## වාරිත්‍ර සීලය

- පරපණ නැසිමෙන් වැළකිම
- නොදුන් දේ සොරෙන් ගැනිමෙන් වැළකිම
- කාමයෙහි වරදවා හැසිරිමෙන් වැළකීම
- බොරු කීමෙන් වැළකීම
- රහමෙර පානයෙන් වැළකී සිටීම

**චාරිත්‍රයෙන් පමණක් සීලය අංග සම්පූර්ණ නොවෙයි වාරිත්‍රයද ඒ සඳහා අවශ්‍ය වෙයි.**

# හිරි ඔත්තප්ප

හිරි ඔත්තප්ප යනු සීලයේ පදනමයි. හික්මීමට හේතුවන ධර්මතා දෙකක් බුදු දහමේ දක්වෙයි. එනම් හිරි ඔත්තප්පයි. (ලැජ්ජාව සහ හය)

**හිරි ඔත්තප්ප**

**ලෝක පාලක ධර්ම**

(ලෝ වැසියන්ගේ හැසිරීම පාලනය කරන කරුණු.)

**දේව ධර්ම**

(දේවත්වයට උසස් කරණ ගුණ ධර්ම.)

හිරි යනු - පව් කිරීමට ඇති ලැජ්ජාවයි.

ඔත්තප්ප යනු - පව් කිරීමට ඇති බියයි.

සීලය සමාදන් වීම යනු තමන් තමන්ටම පොරොන්දු වීමකි. “ පාණාතපාතා වේරමණී සික්ඛා පදං සමාධියාමි”

ඉහත සිල් පදය සමාදන් වෙමි යැයි කියන විට සිදු කරන්නේ තමන් තමන්ටම පොරොන්දු වීමකි. එය කඩකරන්නේ නම් ඉන් සිදු වන්නේ තමන් විසින් තමන්වම රවටා ගැනීමකි. බුදු දහම තළ සිල් සමාදන් වීමට ආඥා නොමැත. එනිසා කවරෙකට හෝ බියෙන් සිල් රැකීමක් බුදු දහම තළ නොමැත.

එම ලැජ්ජාව බාහිර බලපෑමක් නිසා නොව කෙනෙකුගේ අභ්‍යන්තරයෙන්ම පැන නඟින්නකි. පව්කම්වල හැකිළෙන පැකිළෙන ගතිය ලැජ්ජාව ඇති අයට නිරන්තරයෙන් සිදුවන්නකි. එම ලැජ්ජාව දහම තළ කොටස් හතරකින් පෙන්වා දී ඇත. එනම්,

1. අක්ධඥත්ත සමුට්ඨාන හිරි (සතුන් මැරීමාදී පව්කම් ජාති මහත්වයක් ඇති කුලීනයන්ගේ හැසිරීමක් නොව හීන දීන පහත් කුල හීනයන්ගේ හැසිරීමක් බව සලකා පවට ලැජ්ජා වීම.)

2. අත්තාධිපතෙය හිරි (තම තත්ත්වය, පැවිදි බව, ගුණ ධර්ම පූරන බව ආදිය සලකා පවට ලැජ්ජාවීම, ලැජ්ජාවෙහි කොටස් හතරක් ඇති බව අ:නි:ට අයත් සංඛිත්තධන සූත්‍රයට අනුව පැහැදිලි වේ.)

3. ලජ්ජාසභාව - ගණ්ඨික හිරි (අනෙක් ලැජ්ජාශීලී අයකු කළ කිරීම ආදී කරුණු පවට ලැජ්ජාවීම)

4. සප්පතිස්සවලක්ඛණ හිරි (තම ජාති මහත්වය, තම ශාසන මහත්වය, තම දායාද මහත්වය තම බ්‍රහ්මචාරී මහත්වය ආදී ගුණ සලකා පව්කම්වලින් වළකින විට ඇතිවන ලැජ්ජාව)

**පව්කම් කිරීමට ඇති බිය හෙවත් ඔත්තප්පය ආකාර හතරකින් දක්වා ඇත.**

- **අත්තානුවාද භිය** (තමාකළ පවු සිහිවීමෙන් තමාගෙන්ම දොස් නැගී තමාට පසුතැවිලි වේ යැයි ඇතිවෙන බිය)
- **පරානුවාද භිය** (තමාට අනුන්ගෙන් දොස් නැගැතෙයි ඇතිවන බය)
- **දණ්ඩ භිය** (වැරදී වැඩක් කිරීමෙන් තමාට දඬුවම් ලබන්නට සිදුවෙතෙයි ඇතිවෙන බිය)
- **දුග්ගති භිය** (පවු කිරීමෙන් අපාගත වීමට සිදුවෙතැයි ඇතිවෙන බිය)

**මේ කියන ලද කරුණු අනුව පවු කිරීමට බිය හෙවත් ඔත්තප්පය වැඩි වශයෙන් ඇතිවන්නේ බාහිර බලපීම් නිසාය.**



# සිලයෙහි ත්‍රිකෝටි පාරිශුද්ධිය

සීලයෙහි ත්‍රිකෝටි පාරිශුද්ධය යනු අංශ තුනකින් හෙවත් තුන් ආකාරයකින් සීලය ආරක්ෂා කිරීමයි. එනම්,

- ➢ පවුකම් නොකිරීම
- ➢ පවුකම නොකරවීම
- ➢ අන් අය කරන විට අනුමත නොකිරීම

මේ ආකාරයට සෙසු ශික්ෂාවන් කෙරෙහි ද තන් ආකාරයකින් සීලය ආරක්ෂා කිරීමෙන් පුද්ගලයාගෙ දියුණුව සැළසේ. කරුණාව දයාව, උසස් මානව ගුණ ධර්ම, සමාජයට දායාද කිරීම මගන් සමාජ සදාචාරයද වර්ධනය වෙයි.



# 01. පාණාතිපාතා වේරමණී සික්ඛාපදං සමාදියාමි

කිසි විට සතෙකු නොමරමි මම නොමරවමි

වෙන අය මරණ විට අනුමත නොම කරවමි

කඩු දුනු මුගුරු මගේ දැතින් බැහැරලමි

සතුනට දයාබර හිතවත් අයෙක් වෙමි



# 02. අදින්නාදානා වේරමණී සික්ඛාපදං සමාදියාමි

නුදුන් දෙයක් සොර සිතින් නොගන්නෙමි

අනුන් ලවා සොරකම් නොකරවන්නෙමි

හොරෙන් ගැනුම අනුමත නොම කරන්නෙමි

ලැබෙන්නකින් සතුටුව දිවි ගෙවන්නෙමි



# 03. කාමේසු මිච්චාචාරා වේරමණී සික්ඛපදං සමාදියාමි

වයසට නොගැළපෙන කම් සැප දුරු කරමි
කුමරුට කුමරියට හිමි බඹසර වෙසෙමි
වරදට පොලොබවන අය ඇසුරට නොයමි
සැම විට චරිතයෙහි පිවිතුරු බව රකිමි



# 04. මුසාවාදා වේරමණී සික්ඛපදං සමාදියාමි

බොරු බස් කියා කිසිවෙකු නොරවටන්නෙමි

කෙනෙකුන් ලවා බොරුවක් නොකියවන්නෙමි

බොරු බස් කීම අනුමත නොම කරන්නෙමි

සැබැවක් වුවද නිසි තැනකම කියන්නෙමි

# 05. සුරාමේරය මජ්ජපමාදට්ඨානා වේරමණී සික්ඛාපදං සමාදියාමි




දුම්වැටි මත් වතුර මත්කුඩු නොබොන්නෙමි
අන් කිසිවෙකු හටත් ඒවා නොදෙන්නෙමි
බොන්නෙකු වෙතොත් අනුමත නොම කරන්නෙමි
සැබැවක් වුවද නිසි තැනක ම කියන්නෙමි

## සීලය දෙයාකාරය . ඉහත දක්වන ලද්දේ වැළකීම හෙවත් විරමණයි.

එනම් නොකළයුතු දේවල් ය. සීලය සම්පූර්ණ වීමට කල යුතු දේවල්ද බුදුදහම අපිට පෙන්වා දෙයි. චාරිත්‍ර හෙවත් සමාදාන යනුවෙන් හැඳීන්වෙන්නේ ඒවාය. එනම්,

1. තමා යහපතෙහි යෙදීම
2. අන් අයද යහපත් ක්‍රියාවන්ට යොමුකරවීම
3. අනුන් කරන යහපත් ක්‍රියා අගය කිරීම

යනුවෙනි.

- පළමු සිල්පදය ගත්විට තමා ප්‍රාණඝාතයෙන් වැළකිම ප්‍රමාණවත් නොවේ. අන් අය ලවාද ප්‍රාණඝාතය සිදු නොකළ යුතුය.

........

- ප්‍රාණඝාතයෙහි යෙදෙන්නන්ට අනුබලදීම හෝ එම ක්‍රියාව අනුමත කිරීම හෝ නොකළයුතුය. ප්‍රාණඝාතයෙන් වැළකීම මෙන්ම සියලු සත්වයන්ට කරුණාවෙන් දයාවෙන් මෛත්‍රී සිතින් යුතුව කටයුතු කිරීම, අන් අය ලවාද එසේ කරවීම මෙන්ම සතුන්ගේ යහපත වෙනුවෙන් කරනු ලබන ක්‍රියා අගය කිරිමද සිදු විය යුතුය.
- දෙවන ශික්ෂාපදය සැලකුවිට තමා සොරකම් නොකිරීම, අන් අය ලවා නොකරවීම මෙන්ම අනුබල නොදීමද කල යුතය.
- එම ශික්ෂා පදයෙහි සමාදානය ලෙස අදහස් කරන්නේ අන් අයගේ දේපල ආරක්ෂා කිරීම, ඒ සදහා අන් අය යොමු කරවීමද ආරක්ෂා කිරීමට අනුබල දිමද වේ.
- ඒ අනුව සිල් පද පහ තුළම වගකිමේ අංශයක් මෙන්ම හැසිරීමේ අංශයක්ද ඇත. පංචසීලය නිසි පරිදි ආරක්ෂා කිරීම යනු මෙම දෙයන්ශයෙන් ම කටයුතු කිරීම බව අප තේරුම්ගත යුතුය.

# අත්තූපනායක ධර්ම පර්යාය

- පංචසීලයේ පළමු ශික්ෂාව වන ප්‍රාණඝාත ශික්ෂාව ආරක්ෂා කිරීමේදී අත්තූපනයක ධර්ම පර්යායට අනුව මෙසේය.
- ලොව ජීවත්වෙන සෑම සත්වයෙක්ම සැපයට කැමැතියි. දුකට අකමැතියි. ජීවත්වීමට කැමති. මරණයට බයයි. එසේනම් අප මෙසේ සිතිය යුතුයි. මා ජීවත්වීමට කැමතියි. සැප විදීමට කැමතියි. මරණයට අකමැතියි. මා දුක පිලිකුල් කරයි.
- පළමුකොට තමන් ගෙන සිතා ඒ අනුව අනුන් ගෙන සිතන ක්‍රමයක් මෙයින් අදහස් කරේ. මේ ක්‍රමය අවශ්‍ය වන්නේ වරදින් මිදීමටයි. කය, වචන දෙකෙන් කරන කියන හැම ක්‍රියාවක්ම තමන්වෙත ආරෝපණය කර විනිශ්චය කිරීම මෙන් අදහස් කෙරේ.
- සිල් රැකීමේදී අත්තූපනායක ධර්ම පර්යාය අනුව ක්‍රියා කිරීම ඉතා වැදගත්ය.



පළමුකොට තමන් ගැන සිතා ඒ අනුව අනුන් ගැන සිතන ක්‍රමයක් මෙයින් අදහස් කරේ. මේ ක්‍රමය අවශ්‍ය වන්නේ වරදින් මිදීමටයි.

කය, වචන දෙකෙන් කරන කියන හැම ක්‍රියාවක්ම තමන් වෙත ආරෝපණය කර විනිශ්චය කිරීම මින් අදහස් කෙරේ.

## ක්‍රියාකාරකම්

1. ත්‍රි ශික්ෂාව දක්වන්න.
2. ලෝක පාලක ධර්ම නම් කරන්න.
3. සිල ශික්ෂාවට අයත් කාරනාංග ලියා දක්වන්න.
4. සීලයේ පදනම වන්නේ කුමක්දැයි ලියා දක්වන්න
5. නිවන් මගේ පදනම වන්නේ කුමක්ද ?
6. ත්‍රීකෝටි පාරිශුධිය ලියන්න.
7. අන්තූපනායික ධර්ම පරියාය යනුවෙන් අදහස් වන්නේ කුමක්ද ?

## පිළිතුරු

1. සීල, සමාධි, ප්‍රඥා
2. හිරි ඔත්තප්ප (ලැජ්ජා භය දෙක)
3. සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව
4. හිරි - ඔත්තප්ප
5. සීලය
6. පව් කම් නොකිරීම
   පව්කම් නොකර වීම
   අන් අය කරන විට අනුමත නොකිරීම
7. තමා උපමාකොට ගෙන සියලු වැරදි වලින් වෙන් වීම


තෙරුවන් සරණයි